පොදු චක්‍රලේඛ ලිපි අංක 02-121/2015

මගේ අංකය සීඑෆ්/ඊඑක්ස්ප්/08/2015
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
සුවසිරිපාය, 385
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත
කොළඹ 10
2015.09. 23 දින

පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන්
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන්
විමධ්‍යගත කොට්ඨාශ භාර ප්‍රධානින්
රේඛීය අමාත්‍යාංශය යටතට ගැනෙන සියලුම රෝහල් අධ්‍යක්ෂකවරුන් හා
ආයතන ප්‍රධානින් වෙත.

**වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ II ශ්‍රේණියේ / II පන්තිය "අ" ඛණ්ඩයේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සහ දෙපාර්තමේන්තු විභාගය - 2015**

වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ II ශ්‍රේණියේ/ II පන්තිය "අ" ඛණ්ඩයේ නිලධාරීන් තම නියමිත වැටුප් පරිමාණයේ හතර වැනි වැටුප් පියවරට එළඹීමට පෙර සමත්විය යුතු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2015/11/14 දින සහ දෙපාර්තමේන්තු පරීක්ෂණය 2015/11/15 දින සිංහල දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන ස්ථානය හා කාලසටහන ප්‍රවේශපත්‍රයේ සඳහන් කරනු ඇත. විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රය පමණක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.

## 02. සුදුසුකම්

2015/10/16 දිනට හෝ ඊට ප්‍රථම වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ II පන්තිය "අ" ඛණ්ඩයට / II ශ්‍රේණියට පත්වීමක් ලබා ඇති නිලධාරීන්ගෙන් මෙතෙක් මෙම විභාගය සම්පූර්ණ නොකරන ලද නිලධාරීන්ට මෙම විභාගයට අයදුම් කළ හැකිය.

## 03. අයදුම්පත්

මෙම චක්‍රලේඛයේ අගට දක්වා ඇති ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් සකස් කර කරගත යුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා මඟින්, කොළඹ 10, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත. අංක 385. සුවසිරිපාය ගොඩනැගිල්ලේ අධ්‍යක්ෂ විභාග වෙත 2015/10/16 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය. සෑම අයදුම්පතකම දක්වා ඇති තොරතුරු නිවැරදි බව කොට්ඨාශ ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය. තම අයදුම්පත සමග නම, ලිපිනය ලියන ලද (**මෙහි රජකාරී ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලිවිය හැකිය**) **රු 35.00 ක්** බැගින් වටිනා මුද්දර ඇලවූ 9"x 4" ප්‍රමාණයේ ලියුම් කවර **(02) දෙකක්** ද එවිය යුතුය. ප්‍රායෝගික සහ වාචික පරීක්ෂණයන්ට පෙනී නොසිටින අයදුම්කරුවන් එක් ලියුම් කවරයක් එවීම ප්‍රමාණවත්ය. **ප්‍රමාද වී ලැබෙන අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත් ප්‍රතික්ෂේප** කරනු ලැබේ.

**සැ.යු. : ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියට අනුව, අයදුම්පත්‍රය $A_4$ කඩදාසියක පළමු පිටුවේ අංක 01 සිට 04 දක්වාත් දෙවන පිටුවේ අංක 05 සිට 09 දක්වාත් සකස් කළ යුතුය. ඉහත ආකෘතියට අනුකූල නොවන සියලුම අයදුම්පත්‍ර නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

## 04. විභාග ගාස්තු

I විභාගයට පළමුවන වතාවට ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ. අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු. 25.00 බැගින් අවලංගු නොකළ මුද්දර ඉල්ලුම් පත්‍රයේ අලවා තමන්ගේ අත්සන හා දිනය යොදා අවලංගු කළ යුතුය.

II කිසිඳු කරුණක් මත ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදුකරනු නොලැබේ.

## 05 විභාගයට ඇතුලත් කර ගැනීම.

I පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂක / අපේක්ෂිකාවන්ට ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත්‍රය නියමිත පරිදි සම්පූර්ණ කර ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ නොමැතිව විභාගයට පෙනී සිටිමට ඉඩදෙනු නොලැබේ.

II විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුලදී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය තහවුරු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලිවලින් එකක් ඉදිරිපත් කළ යුතුය.

(අ) ජාතික හැඳුනුම්පත්‍රය.
(ආ) දෙපාර්තමේන්තු හැඳුනුම්පත්‍රය.
(ඇ) වලංගු රියදුරු බලපත්‍රය.
(ඈ) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

## 06. විභාග පටිපාටිය

මෙම විභාග දෙපාර්තමේන්තු විභාගය සහ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය වශයෙන් පැවැත්වේ. දෙපාර්තමේන්තු පරීක්ෂණය විෂයානුබද්ධ රචනා ප්‍රශ්න පත්‍රයකින්, වාචික පරීක්ෂණයකින් සහ ප්‍රායෝගික පරීක්ෂණයකින් සමන්විත වන අතර කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි යනුවෙන් ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ. එකවරක දී හෝ කිහිපවරක දී කොටස් වශයෙන් පෙනී සිට විභාගය සම්පූර්ණ කළ හැකිය. පළමුවරට විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් සියලුම විෂයයන් අයදුම් කළ යුතුය.

## 07. විභාග නිර්දේශ මාලාව

### 07.1 දෙපාර්තමේන්තු පරීක්ෂණය

#### 07.1.1 ලිඛිත විභාගය - විෂයානුබද්ධ

කාලය පැය 03 යි. මෙම රචනා ප්‍රශ්න පත්‍රය 07 කින් සමන්විත වන අතර එයින් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයිය යුතුය. මුළු ලකුණු 100 කි. සමත්වීම සඳහා අවම වශයෙන් ලකුණු 40 ලබා ගත යුතුය.

**විෂය නිර්දේශය**

i. රසායනාගාර තාක්‍ෂණවල මූලධර්ම හා ප්‍රගුණ කිරීම

(අ) ක්ෂුද්‍ර ජීව විද්‍යාව.
(ආ) රසායන ව්‍යාධිවේදය.
(ඇ) රක්තවේදය.
(ඈ) සායන ව්‍යාධිවේදය.
(ඉ) පටක ව්‍යාධිවේදය

ii. රසායනාගාර කළමණාකරනය

iii. උපකරණ නඩත්තුව හා අළුත්වැඩියා කිරීමේ ක්‍රියාවලිය.

iv. රසායනාගාරයේ ආරක්‍ෂා පිළිවෙල.

v. දෙපාර්තමේන්තු ක්‍රියා පටිපාටිය

(අ) උපකරණ රසායන ද්‍රව්‍ය යනාදිය ඉල්ලුම් කිරීම
(ආ) ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ ඉවත් කිරීමේ පිළිවෙත
(ඇ) රසායන ද්‍රව්‍ය ලබාගැනීම, ගබඩා කිරීම, නිකුත් කිරීම හා ගණන් තැබීම.

#### 07.1.2 ප්‍රායෝගික පරීක්ෂණය - විෂය ක්ෂේත්‍රයට අදාළව හැකියාවන් හා ක්‍රියාකාරකම් හා බැඳුනු ප්‍රායෝගික පරීක්‍ෂණයකි. මුළු ලකුණු සංඛ්‍යාව 100කි. සමත්වීම සඳහා අවම වශයෙන් ලකුණු 40 ක් ලබාගත යුතුය.

#### 07.1.3 වාචික පරීක්ෂණය - විෂය ක්ෂේත්‍රයට අදාළව හා සේවයේ යෙදීමේදී එළඹිය හැකි ගැටළු පිළිබඳ වාචික පරීක්‍ෂණයකි. මුළු ලකුණු සංඛ්‍යාව 100 කි. සමත්වීම සඳහා අවම වශයෙන් ලකුණු 40 ක් ලබාගත යුතුය.

## 07.2 කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

මෙම පරීක්ෂණය ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසි වශයෙන් රචනා ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විතය. එක් එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා ලකුණු 100ක් බැගින් වෙන් කෙරේ. සමත්වීම සඳහා අවම වශයෙන් ලකුණු 40 ක් බැගින් ලබාගත යුතුය.

### 07.2.1 ආයතන සංග්‍රහය

මෙම ප්‍රශ්න පත්‍රය පැය (02) දෙකක ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතකින් (07) සමන්විතය. එයින් ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සැපයිය යුතුය.

| | | |
|---|---|---|
| XV | - | අධ්‍යාපනය, අභ්‍යාස හෝ රාජකාරි කටයුතු සඳහා පිටරට යාම. |
| XVI | - | නිවාඩු ගමන් |
| XXIII | - | ඇතැම් වර්ගවල රෝග වලින් පෙළෙන රජයේ නිලධාරීන්ට විශේෂ අනුග්‍රහය සහ ඒ පිළිබඳ කොන්දේසි. |
| XXIV | - | වැටුප් ණය අත්තිකාරම් |
| XXV | - | වෘත්තීය සංගම්වල සාමාජිකයින්ට අනුග්‍රහය. |
| XXVII | - | ලිපි ගනුදෙනු කිරීමේ මාර්ග. |
| XXVIII | - | පරිපාලන කාර්ය පරිපාටි සහ විධි. |
| XXX | - | රාජ්‍ය නිලධාරීන් සම්බන්ධව ආණ්ඩුව සතු බලතල. |
| XXXIII | - | නීති උපදෙස් සහ නීතික්‍රියා මාර්ග. |
| XLVII | - | සාමාන්‍ය හැසිරීම සහ විනය |
| XLVIII | - | විනය කාර්ය පරිපාටිය. |

නිලධාරීන්ගේ කාර්ය සාධන ඇගයීම් පිළිබඳ රාජ්‍ය පරිපාලනය චක්‍රලේඛය ද අදාල වේ.

### 07.2.2 මුදල් රෙගුලාසි

මෙම ප්‍රශ්න පත්‍රය පැය (02) දෙකක ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතකින් (07) සමන්විතය. එයින් ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සැපයිය යුතුය.

| | | |
|---|---|---|
| VI වන පරිච්ඡේදය | - | ආණ්ඩුවේ මුදල් යනාදියෙහි භාරකාරත්වය, අග්‍රිමය සහ බැංකු ගිණුම්: රාජ්‍ය මුල්‍ය සුරක්ෂිතභාවය, සමීක්ෂණ මණ්ඩලය, අයිරාව බැංකු ගිණුම්. (මුදල් රෙගුලාසි 315 සිට 396 දක්වා) |
| XIII වන පරිච්ඡේදය | - | සැපයීම් වැඩ සහ සේවා: සැපයීම් / සැපයීම් මිලට ගැනීමේ ක්‍රියාවලිය, සමීක්ෂණය ගබඩාකරණ ක්‍රියාවලිය, කොන්ත්‍රාත්, ටෙන්ඩර් පරිපාටියෙන් බැහැර වීම. (මුදල් රෙගුලාසි 708 සිට 775 දක්වා) |

**08** කරුණාකර මෙම චක්‍රලේඛයේ අඩංගු දෑ ඔබ කොට්ඨාශයේ/ විශේෂිත ව්‍යාපාරයේ/ ආයතනයේ සේවයේ නියුතු අදාළ නිලධාරීන්ගේ දැනගැනීමට සලස්වන්න. මෙම තොරතුරු www.health.gov.lk වෙබ් අඩවියෙන්ද ලබා ගත හැකිය.

සැ.යු **විභාග නිවේදනයේ දෙමළ සහ ඉංග්‍රීසි පරිවර්තනයන් අතර යම් ව්‍යාකූලතාවයක් මතුවුවහොත් සිංහල මාධ්‍ය විභාග නිවේදනය බලපැවැත්වේ.**

එම් බී එල් රහුමාන්
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

| කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි. |
|---|
| |

**ආදර්ශ අයදුම්පත**

**වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ II ශ්‍රේණියේ / II පන්තිය “අ” ඛණ්ඩයේ නිලධාරීන් සඳහා වන**

**කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සහ දෙපාර්තමේන්තු විභාගය - 2015**

**01.** **(අ)** (i) අයදුම්කරුගේ නම ( සිංහලෙන් හෝ දෙමලෙන් මුලකුරු අගට යොදා ලියන්න )

..............................................................................................

(ii) අයදුම්කරුගේ නම ( ඉංග්‍රීසි කැපිටල් අකුරින් මුලකුරු අගට යොදා ලියන්න ) :

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |

(iii) මුලකුරු වලින් හැඳින්වෙන නම් ( සිංහලෙන් හෝ දෙමලෙන් ) : ..................

..............................................................................................

(iv) මුලකුරු වලින් හැඳින්වෙන නම් ( ඉංග්‍රීසි කැපිටල් අකුරින් )

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |

**(ආ)** I මුල් පත්වීමේ දිනය ..............................................................................

II සේවයේ ස්ථිර කරන ලද දිනය සහ ලිපි අංකය ..............................................

III දැන් ලබන වාර්ෂික වැටුප ........................................................................

IV II “අ” ඛණ්ඩයට/ II ශ්‍රේණියට පත්කළ දිනය සහ ලිපි යොමු අංකය

..............................................................................................

V හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

VI දුරකථන අංකය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

**02.** ඔබ මෙවර විභාගයට පෙනී සිටිමට අපේක්ෂා කරන විෂයන් ඉදිරියේ ඇති කොටුව තුළ (√) ලකුණ යොදන්න. පෙනී නොසිටින්නේ නම් (×) ලකුණ යොදන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| විෂයානුබද්ධ | ☐ | ආයතන සංග්‍රහය | ☐ | ගිණුම් | ☐ |
| ප්‍රායෝගික | ☐ | වාචික | ☐ | | |

**03.** විභාගයට පෙනී සිටින මාධ්‍යය - (සිංහල/ ඉංග්‍රීසි/ දෙමළ) - ..............................................

**04.** (අ) දැන් සේවය කරන ආයතනය ..............................................................

(ආ) එය අයත් දිස්ත්‍රික්කය ..............................................................

(ඇ) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා පැහැදිලිව ලිපිනය ලියන ලද 9”×4” ප්‍රමාණයේ රු 35.00 ක මුද්දර ඇලවූ ලියුම්කවරයක් ද ප්‍රායෝගික වාචික පරීක්ෂණ දන්වා එවීමට රු 35.00ක මුද්දර ඇලවූ ලියුම්කවරයක් ද අයදුම්පත්‍රයට අමුණන ලද්දේද? ..........................................

(ඈ) (i) තැපැල් ලිපිනය ( සිංහලෙන් හෝ දෙමලෙන් ) ..........................................

..............................................................................................

(ii) තැපැල් ලිපිනය ( ඉංග්‍රීසි කැපිටල් අකුරින් ) ..........................................

..............................................................................................

05. (අ) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේද? ......................................................

(ආ) එසේ පෙනී සිට ඇත්නම් මෙවර වෙනුවෙන් මුද්දර අලවා තිබේද?....................................

| |
|---|
| මුද්දර කොටුව |

## 06. අයදුම්කරුගේ සහතිකය

මගේ දැනුම හා විශ්වාසය පරිදි

(i) මම ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත් මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත් ප්‍රථම වතාවට නොවන බැවින් රු.............. ක් වටිනා මුද්දර අලවා ඇති බවත් මෙම ඉල්ලුම් පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.

(ii) සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීති වලට එකඟව ක්‍රියාකිරීමටත්, මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකගවන බවත් සහතික කරමි.

දිනය ...................... ..........................................

අයදුම්කරුගේ අත්සන

## 07. පෞද්ගලික ලිපිගොනු භාර විෂය කළමනාකරණ සහකාරවරයාගේ / සහකාරවරියගේ සහතිකය

මෙම අයදුම්පත බාර ගන්නා අවසාන දිනයට පෙර මා වෙත බාරදුන් බවත්, පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරුවලට අනුව අයදුම්කරු විසින් නිවැරදිව මෙම අයදුම්පත සම්පූර්ණ කර ඇති බවත්, මෙම අයදුම්පතේ පිටපතක් පෞද්ගලික ලිපි ගොනුවට ගොනුකළ බවත් සහතික කරමි.

දිනය ........................ ............................

නම සහ අත්සන

## 08. ආයතන ප්‍රධානියාගේ සහතිකය

..........................................................මහතා / මහත්මිය / මෙනවිය මෙම ආයතනයේ සේවයේ නියුතු වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ II පන්තිය “අ” බණ්ඩයේ/ II ශ්‍රේණියේ නිලධාරියකු වන අතර, අයදුම්පත්‍රයෙහි දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට වන/ නොවන බවටද රු ............ ක් වටිනා මුද්දර මෙම මුද්දර ඉල්ලුම් පත්‍රයට අලවා ඇති බවද/ මුද්දර ඇලවීමට අනවශ්‍ය බවටද මා ඉදිරිපිටදී අත්සන් කළ බවද සහතික කරමි

දිනය ........................ ................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන

(රබර් මුද්‍රාව තැබිය යුතුයි)

## 09. විමධ්‍යගත කොට්ඨාශ / විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ සහතිකය

..........................................................මහතා / මහත්මිය / මෙනවිය මෙම ආයතනයේ සේවයේ නියුතු වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ II පන්තිය “අ” බණ්ඩයේ/ II ශ්‍රේණියේ නිලධාරියකු වශයෙන් මගේ කොට්ඨාශයේ /ව්‍යාපාරයේ සේවය කරන බවත්, අයදුම්පත්‍රයෙහි දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

දිනය ......................... .............................................

විමධ්‍යගත කොට්ඨාශ/ විශේෂිත
ව්‍යාපාර ප්‍රධානියාගේ අත්සන
(රබර් මුද්‍රාව තැබිය යුතුය)

(අනවශ්‍ය කොටස් කපා හරින්න)

General Circular Letter No: 02-121/2015

My No. CF/EXE/08/2015
Ministry of Health, Nutritions and Indigenous Medicine
"Suwasiripaya"
385, Ven. Baddegama Wimalawansa Thero Mw.
Colombo 10.
23rd September 2015

Provincial Health Secretaries
Provincial Directors of Health Services
Regional Directors of Health Services
Heads of Decentralized Units
Directors of Hospitals under the Line Ministry &Heads of Institutions

**Efficiency Bar Examination & Departmental Examination for**
**Medical Laboratory Technologists in Grade II / Class II Segment "A" - 2015**

It is hereby notified that the Efficiency bar Examination and the Departmental Examination which should be passed before reaching the fourth salary step of the salary scale approved for Medical Laboratory Technologists Class II Segment “A”/ Grade II, will be held respectively on 14/11/2015 and 14/11/2015 in Sinhala, Tamil and English media. The venue and the time of the examination will be notified along with the Admission Card. The subject related question paper will be prepared only in English Language.

**02. Qualifications:-**

Medical Laboratory Technologists appointed to class II seg "A" /Grade II on or before 16/10/2015 and not have completed this examination up to now can apply for this examination

**03. Applications:-**

Applications prepared by the candidates as per form of specimen appended to this letter should be sent under registered cover to reach the Director (Examinations) "Suwasiripaya" No.385, Ven. Baddegama Wimalawansa Thero Mawatha, Colombo 10, **on or before 16/10/2015** through their Heads of Institutions. The Head of Division should certify the accuracy of contents in each application. Two self addressed envelopes in the size of 9" x 4" inches affixed with stamps separately to the **value of Rs. 35.00** should be sent along with the application. Those who do not apply for Practical / Viva Tests should send only one envelop along with the application. Candidates can write their official or private address on the envelopes. Applications which are received late, incomplete or inaccurate will be rejected.

**Note : The application should be prepared using an A4 paper based on the specimen form of the application so as to recommended from 01 to 04 on the first front page and from 05 to 09 on the second page. Applications which do not conform to above will be rejected any information.**

**04. Examination fees:-**

I. Candidates who sit the examination for the first time need not pay examination fees. However in every subsequent sitting they should affix stamps to the value of Rs. 25/= per subject in the stamps cage provided for in the application and cancel same by placing their signature and the date.

II. The fees once paid will not be refunded or transferred to other examinations under any circumstances.

**05.** I **Admission to the Examination: -** Candidates whose applications have been accepted will be issued with Admission Cards which should be submitted to the Supervisor at the Examination centre.

II Candidates should prove their identity to the Supervisor at the examination centre. For this purpose one of the following documents will be accepted.

( a ) National Identity Card

( b ) Departmental Identity Card

( c ) Valid Driving License

( d ) Valid Passport

**06. Scheme of the Examination: -**

The examination consists of two parts viz Departmental Examination and Efficiency Bar Examination .There will be three essay type written question papers, Viva Voce and a Practical test. Marks 100 have been assigned for each part and candidates should score minimum of 40 marks for each part to obtain a pass in the examination. They can complete the examination in one sitting or in several sittings. However candidates who sit the examination for the first time should sit for all the four subjects.

**07.1 Syllabus of the Examination**

**07.1.1 Subject related**

Duration 03 hours. Should answer 04 out of 07 questions. Total 100 Marks. Candidate should secure minimum of 40 marks for Paper to have a pass in the Examination.

I Practicing principles of Laboratory technologies

(a) Microbiology

(b) Chemo Pathology

(c) Hematology

(d) Clinical Pathology

(e) Histo Pathology

II Laboratory Management

III Maintenance of equipment and the process of repairs

IV Laboratory safety methods

V Departmental procedure

(a) Indent equipment and Chemicals etc.

(b) Disposal of unserviceable items

(c) Receipt, storage ,issuing and accounting chemicals.

**07.1.2. Practical test** - A practical test relate to the subject field. to examine skill and abilities practically. Total 100 Marks. Candidate should secure minimum of 40 marks for Paper to have a pass in the Examination

**07.1.3. Viva Voce** - An oral test on issues that would arise in the subject field. Total 100 Marks. Candidate should secure minimum of 40 marks for Paper to have a pass in the Examination

### 07.2 Efficiency Bar Examination

#### 07.2.1. Office Administration and Establishments Code (02 Hours)

There will be Two Questions Papers as Establishment Cord & Financial Regulation each Questions Paper will comprised of seven Question & candidates are required to answer any four questions out of them. Total marks 100. Candidate should secure minimum of 40 marks for each Paper to have a pass in the Examinations.

**Questions will be prepared on following chapter of the Establishment Code.**

| | | |
|---|---|---|
| Chapter XV | - | Travel abroad for study Training or on duty. |
| Chapter XVI | - | Holiday Travel |
| Chapter XXIII | - | Special concessions and conditions regarding officers suffering from special type of illness. |
| Chapter XXIV | - | Salary loans/Advances |
| Chapter XXV | - | Connections to trade union Members |
| Chapter XXVII | - | Channel of Communication |
| Chapter XXVIII | - | Administrative Procedure |
| Chapter XXX | - | Right of Government over its Officers |
| Chapter XXXIII | - | Legal advice and legal actions |
| Chapter XLVII | - | General Conduct and discipline |
| Chapter XLVIII | - | Disciplinary Procedure |

Public Administration Circulars on officers' performances and evaluation will also apply.

#### 07.2.2 Financial Regulations. (02 Hours)

Questions will be based on following chapters.

(1) Chapter VI
Custody of Public Finances etc.
Imp rest and Bank Accounts – Security of Public Finances, Board of Survey, Bank Draft, and Bank Accounts. (F.R. 315 – 396)

(2) Chapter XIII
Supplied works and services: - Supplies/ Purchasing system, Stores Verifications Storage System, Contracts Deviation from tender procedure (FR – 708 – 775)

**08.** Please bring the contents of this circular to the notice of all eligible officers in your Division/ Specialized Campaign/Institution. The information is also available in the Web Site– www.health.**gov.lk**

**n.b - Sinhala medium notification on examination will be effected if any contradictory is arisen in the examination notifications published in Tamil and English mediums.**

**M B L Rahuman**
Deputy Director General (Admin) II
For Director General of Health Services

| For Office Use Only |
| --- |
| |

# Specimen form of application

## Efficiency Bar Examination & Departmental Examination for Medical Laboratory Technologists in Grade II / Class II Segment "A" - 2015

01. (a) i. Name of the Applicant (In English with initials at the end) : ..................................

..........................................................................................................................

ii. Name of the Applicant (In Block Letters with initials at the end)

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |

iii. Names denoted by initials ( In Block Letters)

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |

(b) i. Date of first appointment :-............................................

ii. Reference number and the date of the letter Of confirmation } :-............................................

iii. Annual Salary :-............................................

iv. Date and reference of appointment to the Seg. “A”/Grade II :-......................................

..........................................................................................................................

v National Identity card No

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|

vi Telephone No

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|

02. Subjects Offered (Mark “✓” within the cages against the subjects you offer in this Examination. Mark “X” against the subjects not offered)

Subject Related [ ] Est. Code [ ] Fin Reg. [ ]

Practical [ ] Viva Voce [ ]

03. Medium you sit for the examination (Sinhala / English / Tamil)...................................................

04. (a) Present Station :- .......................................................................................................

(b) District of the Present Station : -...................................................................................

(c) Whether two self-addressed envelops in the size of 9 X 4 inches with stamps separately affixed to the value of **Rs.35.00,** have been attached to the application?

……………………………………………………………………….................................

(d) Postal Address to post the Admission Card (In Block Capitals) :- ....................................

..........................................................................................................................

05 (a) Whether you sit for the examination for the first time: -.........................................

(b) If so not, have you affixed stamps to the application? :-.........................................

Stamp Cage

06. Certificate of the candidate:-

(i) I do hereby certify that the particulars furnished by me in this application are true and accurate to my knowledge and I need not affix stamps since I sit the Examination for the first time / have affixed stamps to the value of Rs. .......... since I repeat the Examination,* and the stamps affixed by me to the application are genuine and not used before.

(ii) I agree to abide by the rules and regulations stipulated by the Department of Health for the conduct of this Examination and if I was found ineligible in accordance with the scheme of the Examination I agree with whatever decision taken for the cancellation of my candidature.

Date ............................ .........................................
Signature of the candidate

07. **Certification of the subject management assistant who keeps the personal files**

It is here certified that the application was forwarded to before the closing date. The application has been completed according to the details of the personnel file by the applicant. A copy of the application has been filed.

........................ ........................................................
Date Name and Signature

08. Certification of Head of Institution

Mr/Mrs/Miss .............................. serves as a Medical Laboratory Technologists in class II Seg "A"/ Grade II in my institution and he / she* sits the Examination for the first time / repeats the Examination * he / she* need not affix stamps / has affixed stamps to the value of Rs. ................ to the Application and in the Application are correct in accordance with the particulars available in his /her *personal file. he / she* placed his / her* signature in my presence..

......................... .........................................................
Date Signature of Head of Institution/Frank/Rubber Stamp

09. Certificate of the Head of Decentralized unit / specialized Campaign

*Mr/Mrs/Miss ........................................................................................... serves as a Medical Laboratory Technologists in class II Seg "A"/ Grade II in my Division / Campaign* and the particulars furnished by him / her* in the Application are correct in accordance with the particulars available in his / her* personal file and he / she* is eligible to sit for the Examination.

......................... ..........................................................................
Date Signature of Head of Decentralized Unit /Specialized campaign
(Frank / Rubber stamp)

* - Delete words which are inapplicable